සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

08 ශ්‍රේණිය | වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019 | 44 S I

**නර්තනය - I කොටස** | **කාලය පැය 2**

**ඇතුලත් වීමේ අංකය :**

සැලකිය යුතුයි :- • සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**• 1-10 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා නිවැරදි වරණය තෝරන්න.**

01. තා තෙයි තා තෙයියත් තා...... මෙය කීවෙනි පාසරඹයද?
    i. 5 වෙනි පා සරඹය යි. ii. 6 වෙනි පා සරඹය යි. iii. 7 වෙනි පා සරඹය යි. iv. 8 වෙනි පා සරඹය යි.

02. 5 වෙනි ගොඩ සරඹයේ කස්තිරම වනුයේ,
    i. රුංතක ජිංතක තරිකිට කුංදත්...  ii. කුද ගත ගත ගත කුකුදත්...
    iii. තාං දොමිති ගත දොමිකිට  iv. තත් ජිත් තොං නං තා

03. මැදුම් තනිතිතට අයත් වන තාල රූපය වන්නේ,
    i. මාත්‍රා 2/2 ය.  ii. මාත්‍රා 3/3 ය.  iii. මාත්‍රා 4/4 ය.  iv. මාත්‍රා 2/3 ය.

04. උඩරට බෙර වාදනයේදී සතර බීජාක්ෂර ලෙස හඳුන්වන්නේ,
    i. තත්, දිත්, තොං, නං ය.  ii. තත්, ජිං, තොං, නං ය.
    iii. තත්, ජිත්, තොං, නං ය.  iv. තත්, තොං, නං, ජිත්, ය.

05. සන්නියකුම හෙවත් දහඅට සන්නිය නැමති කෘතිය රචනා කරන ලද්දේ,
    i. හීන් නිලමේ ගුරුතුමාය.  ii. එස්. පණීභාරත ගුරුතුමාය.
    iii. කේ.එස්. ප්‍රනාන්දු ගුරුතුමාය.  iv. මුදියන්සේ දිසානායක ගුරුතුමාය.

06. නාට්‍ය ශාස්ත්‍රය නම් කෘතිය රචනා කරන ලද්දේ,
    i. භරත මුණිවරයා ය.  ii. නන්දිකේශ්වර ය.  iii. උදයශංකර් ය.  iv. වඩිවේලු ය.

07. ද්‍රවිඩ ජනයාගේ ආගමික උත්සවයකි,
    i. නත්තල් උත්සවය.  ii. නවරාත්‍රි උත්සවය.  iii. රාමසාන් උත්සවය.  iv. වෙසක් උත්සවය.

08. රත්න දීප ජන්ම භූමි... යන ගීතයේ පද රචනය කාගේද?
    i. මහගම සේකරයන්ගේ ය.  ii. පණ්ඩිත් අමරදේවයන්ගේ ය.
    iii. ප්‍රණීත් අබේසුන්දරයන්ගේ ය.  iv. ලයනල් අල්ගමයන්ගේ ය.

09. තෙල්මේ, අස්නේ, මුදුන් තාලය යන නර්තන අංග අයත් වන ශාන්ති කර්මයන් වන්නේ,
    i. දොවොල් මඩුව, පහන් මඩුව, කොහොඹා කංකාරිය.
    ii. පහන් මඩුව, කොහොඹා කංකාරිය, දොවොල් මඩුව.
    iii. දොවොල් මඩුව, කොහොඹා කංකාරිය, පහන් මඩුව.
    iv. කොහොඹා කංකාරිය, දොවොල් මඩුව, පහන් මඩුව.

10. නර්තන කලාවේ ඉතිහාසය හා සම්බන්ධ ලෝකඩ නටරාජා පිළිරුව අයත් වන්නේ,
    i. අනුරාධපුර යුගයටයි. ii. පොළොන්නරු යුගයටයි.  iii. ගම්පල යුගයටයි.  iv. යාපහුව යුගයටයි.

**• 11 සිට 15 දක්වා දී ඇති A හා B පද කොටස් ගැළපෙන ලෙස තනි ඉරෙන් යා කරන්න.**

| A | B |
|---|---|
| 11. පතුරු. | සේරමන් රජු. |
| 12. සොළසා සංඛය පළමුව.... | දෙතිත. |
| 13. තුන්වියත් තුනඟුළෙකි. | ගැමි නැටුමකි. |
| 14. දෙවොල් මඩුව. | සිරසපාද කවියකි. |
| 15. සුළු මැඳුම්. | පහතරට බෙරය. |

**• 16 සිට 20 දක්වා දී ඇති වගන්ති හරි නම් "✓" ලකුණද වැරදි නම් "X" ලකුණද යොදන්න.**

16. අගය වඩන කවි වරුනා... මෙම ගායනය මාත්‍රා 3/3 තාල රූපයට අයත් වේ. ( )

17. පහතරට බෙරයේ වම් ඇස සුරල් පැත්ත නමින් ද හඳුන්වයි. ( )

18. අලාරිප්පු කතක් නර්තනාංගයකි ( )

19. නවරාත්‍රි උත්සවයේ දී කාලි අම්මාන් පුද ලබයි. ( )

20. වෙස්, උඩැක්කි, පන්තේරු උඩරට නර්තනයට අයත් වේ. ( )

**• 21 සිට 30 දක්වා දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු පහත වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

( රන්සිවිගෙය, නාරිලතා නැටුම, අඹ විදමන, අයිලය, පොළොන්නරු, ගඩලාදෙනිය විහාරය, සවරං නැටුම, සුළු තනි තිත, භයානක රසය, මොනරා, හොරණෑ, තාන්ජාවූර් සහෝදරයන් )

21. කොහොඹාකංකාරි ශාන්තිකර්මයේ දී දෙවියන්ගේ ආභරණ තැන්පත් කරනු ලබන්නේ ........................... තුළයි.

22. කුදගත ගතදොම්... මෙම බෙර පදය ................................................................... තිතට අදාළ වේ.

23. චින්නයියා, පොන්නයියා යන සහෝදරයන් ................................................................................ ලෙස හඳුන්වයි.

24. හේවිසි වාදනය සඳහා දවුල, තම්මැට්ටම, හා ................................................................................ යොදා ගනියි.

25. ඇසළ පෙරහැර මංගල්‍යයේ දී දළදා කරඬුව තැන්පත් කරනුයේ ................................................ තුළයි.

26. දෙවොල් මඩුවේ නාට්‍යමය අවස්ථාවක් ලෙස ........................................................................... දැක්විය හැක.

27. ඇස්. පණීභාරතයන්ගේ නර්තන නිර්මාණයක් ලෙස ................................................................. හඳුන්වයි.

28. ගල් කැටයම් සඳහා ............................................................................................ ප්‍රචලිතය.

29. අංක 2 දරණ ශිව දේවාලය අයත් වන්නේ ........................................................ යුගයටයි.

30. මිනිසෙකු පාගා දැමීමට සැරසෙන අලියෙකු දැකීමෙන් මාහට ............................................. දැණින.

## II කොටස

**• ප්‍රශ්න 4 කට පමණක් පිළිතුරු සපයන්න.**

01. I. ජිං ගත ගොගො යන බෙර පදය අදාළ තිතට ප්‍රස්ථාර කරන්න.
    II. තුරඟා වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න. ( ලකුණු 10)

02. I. කොහොඹාකංකාරි ශාන්තිකර්මයට අයත් නර්තන අංග 4 ක් ලියන්න.
    II. දොවොල් මඩුවේ හෝ පහන් මඩුව ශාන්ති කර්මයට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ඇඳ කොටස් නම් කරන්න. ( ලකුණු 10)

03. I. නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූ නර්තන ශිල්පියෙක් පිළිබඳ විස්තරයක් කරන්න.
    II. පොළොන්නරු යුගයෙහි නර්තන කලාව පැවති බවට සාධක 2 ක් ඉදිරිපත් කරන්න. ( ලකුණු 10)

04. I. භරත නර්තන සම්ප්‍රදාය පැවති ප්‍රදේශ නම් කරන්න.
    II. භරත නර්තන සම්ප්‍රදායෙහි කාන්තා රංග වස්ත්‍රාභරණ කට්ටලයට අයත් කොටස් 4 ක් නම් කරන්න. ( ලකුණු 10)

05 I. "මහනුවර දළදා පෙරහැර" මැයෙන් රචනාවක් ලියන්න. ( ලකුණු 10)

**නර්තනය 2019**
**8 ශ්‍රේණිය වර්ෂ අවසාන වාර පරීක්ෂණය**

**ප්‍රායෝගික පරීක්ෂණය**

| ප්‍රශ්න අංකය | ප්‍රශ්න අපේක්ෂිත ප්‍රතිචාර | ලකුණු |
|---|---|---|
| 01 | ක්‍රියාකාරකම - ගායනය<br>(1) කැමති ගායනයක්<br>(2) නම් කරන ලද ගායනයක් | 5 |
| 02 | ක්‍රියාකාරකම - සරඹ නැටීම<br>(1) නම් කරන ලද පා සරඹයක් නැටීම හා හමාර පදය නැටීම 2<br>(2) නම් කරන ලද ගොඩ සරඹයක් නැටීම හා කස්තිරම නැටීම 3 | 5 |
| 03 | ක්‍රියාකාරකම - වන්නම නැටීම<br>(1) වෛරෝඩි වන්නමේ මාත්‍රා 2 ක් නැටීම<br>(2) වන්නමට අදාළ කස්තිරම, අඩව්ව නැටීම | 10 |
| 04 | ක්‍රියාකාරකම - නිර්මාණ කුසලතා<br>(1) චරිත නිරූපනයක් (සත්ව/මිනිස්) ( ගුරු භවතා නම් කරන්න) | 10 |
| | **මුළු ලකුණු** | **30** |

## වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
## නර්තනය - පිළිතුරු පත්‍රය

**8 ශ්‍රේණිය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. iii | 2. i | 3. ii | 4. iii | 5. iii | 6. i | 7. ii | 8. i | 9. iii | 10. ii |

11. පතුරු - ගැමි නැටුමකි.

12. සොළසා සංබය - සිරසපාද කවියකි.

13. තුන්වියත් තුනඟුලකි - පහතරට බෙරය.

14. දෙවොල් මඩුව - සේරමාන් රජු.

15. සුළු මැදුම් - දෙතිත.

16. ✓

17. X

18. X

19. X

20. ✓

21. අයිලය

22. සුළු තනිතිත

23. තාන්ජාවුර් සහෝදරයන්

24. හොරණෑව

25. රන්සිවි ගෙය

26. අඹ විදමන

27. නාරිලතා නැටුම

28. ගඩලාදෙනිය

29. පොළොන්නරු

30. භයානක රසය

II පත්‍රය

★ ප්‍රශ්න අංක 1 - 5 එක් ප්‍රශ්නයකට ලකුණු 10.

| | |
|---|---|
| I පත්‍රය සඳහා ලකුණු | 40 |
| II පත්‍රය සඳහා ලකුණු | 30 |
| ප්‍රායෝගික පරීක්ෂණයට | 30 |
| මුළු ලකුණු | 100 |